රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 242

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1984 මාර්තු මස 08 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
සංස්ථා සභාපතිවරුන් වෙත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ සිංහල හා දෙමළ භාවිතය පිළිබඳ විධිවිධාන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදය භාෂාව, උපුටා ඇමුණුමෙහි දක්වා ඇත.

2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ භාෂාව පිළිබඳ විධිවිධාන තරයේ පිළිපදින බවට කරුණාකර වගබලා ගන්න.

3. මෙම චක්‍රලේඛය නිකුත් කරන්නේ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ එකඟත්වය ඇතිවය.

Siriwardhana

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

IV වන පරිච්ඡේදය

භාෂාව

18. ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාව සිංහල භාෂාව වන්නේය. රාජ්‍ය භාෂාව.

19. සිංහල භාෂාව සහ දෙමළ භාෂාව ශ්‍රී ලංකාවේ ජාතික භාෂා වන්නේය. ජාතික භාෂා.

20. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට හෝ පළාත් පාලන ආයතනයක සභිකයකුට පිළිවෙලින් පාර්ලිමේන්තුවේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ හෝ ජාතික භාෂා දෙකෙන් කවර භාෂාවකින් වුව ද තමාගේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමට හිමිකම ඇත්තේය. පාර්ලිමේන්තු වෙහි සහ පළාත් පාලන ආයතනවල ජාතික භාෂා භාවිතය.

21. (1) යම් තැනැත්තකුට ජාතික භාෂා දෙකෙන් කවර මාධ්‍යයකින් වුව ද අධ්‍යාපනය ලැබීමට හිමිකම ඇත්තේය : ඉගැන්වීමේ මාධ්‍යය

එසේ වුවද ජාතික භාෂාවක් නොවන භාෂාවක් ඉගැන්වීමේ භාෂා මාධ්‍යය වන උසස් අධ්‍යාපන ආයතනයකට මෙම අනු ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ නොවන්නේය.

(2) රජය විසින් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් හෝ මුදල් සපයනු ලබන යම් විශ්ව විද්‍යාලයක යම් පාඨමාලාවක් සඳහා නැතහොත් යම් අංශයක හෝ පීඨයක ඉගැන්වීමේ මාධ්‍යය එක් ජාතික භාෂාවක් වන අවස්ථාවක එම විශ්ව විද්‍යාලයට ඇතුළත්වීමට කලින් අනෙක් ජාතික භාෂා මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා ඇති ශිෂ්‍යයන් වෙනුවෙන් එකී අනෙක් ජාතික භාෂාව ද එකී පාඨමාලාව සඳහා නැතහොත් එකී අංශයෙහි හෝ පීඨයෙහි ඉගැන්වීමේ මාධ්‍යයක් කළ යුත්තේ ය :

එසේ වුව ද එකිවිශ්ව විද්‍යාලයේ වෙනත් යම් මණ්ඩපයක හෝ ශාඛාවක හෝ ඒ හා සමාන වෙනත් යම් විශ්ව විද්‍යාලයක යම් මණ්ඩපයක හෝ ශාඛාවක හෝ ඒ හා සමාන පාඨමාලාවක් සඳහා නැතහොත් ඒ හා සමාන අංශයක හෝ පීඨයක ඉගැන්වීමේ මාධ්‍යය ඉහත කී අනෙක් ජාතික භාෂාව වන්නේ නම් මෙම අනුව්‍යවස්ථාවේ මෙයට ඉහතින් වූ විධිවිධාන අනුව ක්‍රියා කිරීමට බැඳීමක් නොවන්නේ ය.

(3) මෙම ව්‍යවස්ථාවෙහි '' විශ්ව විද්‍යාලය '' යන්නට කවර වූ හෝ උසස් අධ්‍යාපන ආයතනයක් ඇතුළත් වේ.

22. (1) රාජ්‍ය භාෂාව ශ්‍රී ලංකාව මුළුල්ලේ ම පරිපාලන භාෂාව වන්නේ ය: පරිපාලන භාෂාව

එසේ වුව ද උතුරු පළාතේ සහ නැගෙනහිර පළාතේ රජයේ ආයතන විසින් පොදු වාර්තා තබා ගැනීම සඳහා සහ සියලු කටයුතු ඉටු කිරීම සඳහා පරිපාලන භාෂාව වශයෙන් දෙමළ භාෂාව ද භාවිත කළ යුත්තේය.

(2) තම නිල තත්ත්වයෙන් ක්‍රියා කරන නිලධරයකු නොවන තැනැත්තකුට—

(අ) ජාතික භාෂා දෙකෙන් කවර වූ හෝ භාෂාවකින් කවර වූ හෝ නිලධරයකුගෙන් ඒ නිලධරයාගේ නිල තත්ත්වයෙන් ලිපි ගනු දෙනු භාර ගැනීමට, ඒ නිලධරයාට නිල තත්ත්වයෙන් ලිපි ගනු දෙනු යැවීමට සහ ඒ නිලධරයා සමග ඒ තත්ත්වයෙන් කටයුතු කිරීමට හිමිකම ඇත්තේ ය ;

(ආ) යම් නිල ලේඛනයක්, වාර්තාවක්, ප්‍රකාශනයක් හෝ වෙනත් ලියවිල්ලක් පරීක්ෂා කිරීමට නැතහොත් ඒ ලේඛනයකින්, වාර්තාවකින්, ප්‍රකාශනයකින් හෝ වෙනත් ලියවිල්ලකින් පිටපතක් හෝ උධෘතයක් ලබා ගැනීමට ඔහුට ඇති අයිතිවාසිකම නීතියෙන් පිළිගනු ලබන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි එම ලේඛනයෙන්, වාර්තාවෙන්, ප්‍රකාශනයෙන් හෝ වෙනත් ලිය විල්ලෙන් පිටපතක් හෝ උධෘතයක් ලබා ගැනීමට නැතහොත් එම ලේඛනයේ, වාර්තාවේ, ප්‍රකාශනයේ හෝ වෙනත් ලියවිල්ලේ පරිවර්තනයක් ජාතික භාෂා දෙකෙන් කවර භාෂාවකින් වුව ද ලබා ගැනීමට හිමිකම ඇත්තේ ය ;

(ඇ) ඒ තැනැත්තාට නිකුත් කරනු ලැබීමේ කාර්යය සඳහා යම් නිලධර යකු විසින් යම් ලියවිල්ලක් ලියා අත්සන් කරනු ලබන අවස්ථාවක ඒ ලියවිල්ල හෝ ඒ ලියවිල්ලේ පරිවර්තනයක් හෝ ජාතික භාෂා දෙකෙන් කවර භාෂාවකින් වුව ද ලබා ගැනීමට හිමිකම ඇත්තේය.

(3) ජාතික භාෂා දෙකෙන් කවර භාෂාවකින් වුව ද සිය කටයුතු කරගෙන යන උතුරු හා නැගෙනහිර පළාත්වල පිහිටි යම් පළාත් පාලන ආයතනයකට ඒ භාෂාවෙන් යම් නිලධරයකුගෙන් නිල තත්ත්වයෙන් ලිපි ගනුදෙනු භාර ගැනීමට සහ යම් නිලධරයකුට නිල තත්ත්වයෙන් ලිපි ගනුදෙනු යැවීමට හා නිල තත්ත්වයෙන් ඒ නිලධරයා සමග කටයුතු කිරීමට හිමිකම ඇත්තේ ය.

(4) කවර වූ හෝ ලිඛිත නීතියක් යටතේ සාදනු ලබන නැතහොත් නිකුත් කරනු ලබන සියළුම නියමයන්, ප්‍රකාශනයන්, රීති, අතුරු නීති, නියෝග සහ නිවේදන ද ගැසට් පත්‍රය ද යම් රජයේ ආයතනයක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් භාවිත කරනු ලබන නැතහොත් නිකුත් කරනු ලබන චක්‍රලේඛ සහ ආකෘති පත්‍ර ඇතුළු වෙනත් සියලුම නිල ලේඛන ද ජාතික භාෂා දෙකෙන්ම පළ කළ යුත්තේ ය.

(5) රජයේ සේවයට, අධිකරණ සේවයට, පළාත් පාලන සේවයට, රාජ්‍ය සංස්ථාවකට හෝ ව්‍යවස්ථාපිත ආයතනයකට තැනැත්තන් ඇතුළත් කර ගැනීම සඳහා පැවැත්වෙන යම් විභාගයකදී ජාතික භාෂා දෙකෙන් කවර භාෂා මාධ්‍යයකින් වුව ද පරීක්ෂා කරනු ලැබීමට යම් තැනැත්තකුට හිමිකම ඇත්තේ ය. තවද, තම ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ඒ තැනැත්තාට තිබීම සාධාරණව අවශ්‍ය වන අවස්ථා වන්හි, එවැනි යම් සේවයකට හෝ රාජ්‍ය සංස්ථාවකට හෝ ව්‍යවස්ථාපිත ආයතනයකට හෝ ඇතුළත් කර ගනු ලැබීමෙන් පසු සාධාරණ කාලයක් ඇතුළත එසේ රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ඔහු විසින් ලබා ගත යුතු යයි නියම කිරීමේ කොන්දේසියට එකී හිමිකම යටත් වන්නේ ය :

එසේ වුව ද යම් තැනැත්තකු බඳවා ගනු ලබන ධුරයෙහි කිසිදු කර්තව්‍යයක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ඇත්තේ නම් මිස ඉටු කළ නොහැකි වන අවස්ථාවල දී, එවැනි යම් සේවයකට, රාජ්‍ය සංස්ථාවකට හෝ ව්‍යවස්ථාපිත ආයතනයකට ඇතුළත් කර ගැනීමේ කොන්දේසියක් වශයෙන් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් යම් තැනැත්තකුට තිබිය යුතු යයි නියම කරනු ලැබිය හැක්කේ ය.

(6) මෙම ව්‍යවස්ථාවෙහි—

" නිලධරයා " යන්නෙන් ජනාධිපතිවරයා, යම් අමාත්‍යවරයෙක්, නියෝජ්‍ය අමාත්‍යවරයෙක් හෝ රජයේ ආයතනයක නැතහොත් පළාත් පාලන ආයතනයක යම් නිලධරයෙක් අදහස් වේ.

" රජයේ ආයතනය " යන්නෙන්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක්, රාජ්‍ය සංස්ථාවක් හෝ ව්‍යවස්ථාපිත ආයතනයක් අදහස් වේ.

23. (1) සියලුම නීති සහ අනුනීති පැනවීම නැතහොත් සෑදීම ද එකී සියලුම නීති සහ අනුනීති පළ කිරීම ද, ඉංග්‍රීසි භාෂාවෙන් වූ පරිවර්තනයක් ද ඇතිව ජාතික භාෂා දෙකෙන් ම විය යුත්තේ ය. පදමාලා දෙකක් අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් රාජ්‍ය භාෂාවෙන් වූ පදමාලාව බල පැවැත්විය යුත්තේ ය. **නීති පැනවීමේ භාෂාව.**

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීම ආරම්භ වනතෙක් බලපැවැත් වූ සියලු නීති සහ අනුනීති හැකිතාක් ඉක්මනින් ජාතික භාෂා දෙකෙන් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන්නේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සිංහල භාෂාවෙන් පළ කරනු ලබන නීතිය එසේ පළ කරනු ලැබූ දිනයේ සිට නීතිය සේ සැලකෙන්නේ ය. සිංහල භාෂාවෙන් පළ කරනු ලැබූ නීතියෙන් ඉංග්‍රීසි භාෂාවෙන් වූ අනුරූප නීතිය නිශ්ප්‍රභ වන්නේ ය.

24. (1) ශ්‍රී ලංකාව මුළුල්ලේ ම අධිකරණයන්හි කටයුතු රාජ්‍ය භාෂාවෙන් කළ යුත්තේ ය. ඒ අනුව ඒ අධිකරණයන්හි වාර්තා සහ නඩු කටයුතු රාජ්‍ය භාෂාවෙන් විය යුත්තේ ය. **අධිකරණයේ භාෂාව.**

එසේ වුව ද උතුරු පළාතේ හා නැගෙනහිර පළාතේ මුල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණවල කටයුතු දෙමළ භාෂාවෙන් ද කළ යුත්තේ ය. ඒ අධිකරණවල වාර්තා සහ නඩු කටයුතු දෙමළ භාෂාවෙන් විය යුත්තේ ය. එවැනි යම් අධිකරණයක තීන්දුවට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන විට ඒ අභියාචනය විභාග කරන අධිකරණයේ භාවිතය සඳහා ජාතික භාෂා දෙකෙන් ම වාර්තා පිළියෙල කළ යුත්තේ ය :

එසේ ම තවදුරටත්—

(අ) එවැනි යම් අධිකරණයක වාර්තා රාජ්‍ය භාෂාවෙන් ද තබා ගත යුතුයයි ද නඩු කටයුතු රාජ්‍ය භාෂාවෙන් ද පැවැත් විය යුතු යයි ද අධිකරණ විෂයය භාර අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව, විධාන කළ හැක්කේ ය.

(ආ) එවැනි යම් අධිකරණයක යම් විශේෂ නඩු කටයුත්තක දී ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ නඩු කටයුත්තේ යම්කිසි පාර්ශ්වයක් හෝ ඉල්ලුම්කරුවකු නැතහොත් පාර්ශ්වයක් හෝ ඉල්ලුම්කරුවකු නියෝජනය කිරීමට නීතියෙන් බලය ලබා ඇති තැනැත්තකු හෝ දෙමළ භාෂාව නො දන්නා අවස්ථාවක, ඒ විනිශ්චයකාරවරයා හෝ පාර්ශ්වකරු හෝ ඉල්ලුම්කරු හෝ තැනැත්තා හෝ විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් ඒ නඩු කටයුත්තේ වාර්තාව රාජ්‍ය භාෂාවෙන් ද තබා ගත යුත්තේ ය.

(2) යම්කිසි පාර්ශ්වයක් හෝ අයදුම්කරුවකු විසින් නැතහොත් ඒ පාර්ශ්වය හෝ අයදුම්කරු නියෝජනය කිරීමට නීතියෙන් බලය ලබා ඇති යම්කිසි තැනැත්තකු විසින්, නඩු කටයුතු ආරම්භ කිරීම ද, උත්තරවාද සහ වෙනත් ලේඛන අධිකරණයට ඉදිරිපත් කිරීම ද, අධිකරණ කටයුතුවලට සහභාගිවීම ද, ජාතික භාෂා දෙකෙන් කවර භාෂාවකින් වුව ද කරනු ලැබිය හැක්කේ ය.

(3) අධිකරණයක භාවිත වන භාෂාව නොදන්නා යම්කිසි විනිශ්චයකාරවරයකුට, ජූරි සභිකයකුට, යම්කිසි පාර්ශ්වයකට හෝ අයදුම්කරුවකුට නැතහොත් ඒ පාර්ශ්වය හෝ අයදුම්කරු නියෝජනය කිරීමට නීතියෙන් බලය ලබා ඇති යම්කිසි තැනැත්තකුට එම අධිකරණයේ සිදුවන කටයුතු වටහා ගැනීමටත් ඒ කටයුතුවලට සහභාගිවීමටත් හැකි වන සේ රජය විසින් උචිත ජාතික භාෂාවෙන් සපයනු ලබන භාෂණ පරිවර්තන සහ පරිවර්තන ලබා ගැනීමටත්, නඩු වාර්තාවකින් නීතිය අනුව ලබා ගැනීමට හිමිකම් ඇති කවර වූ හෝ කොටසක් නැතහොත් එහි පරිවර්තනයක් ජාතික භාෂා දෙකෙන් කවර භාෂාවකින් වුව ද ලබා ගැනීමටත් හිමිකම ඇත්තේ ය.

(4) අධිකරණ විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව සියලු කාර්ය සඳහා නැතහොත් ඔහු විසින් නිශ්චය කොට දක්වන යම් යම් කාර්ය සඳහා නඩු වාර්තාවක හෝ නඩු කටයුත්තකදී නැතහොත් නඩු වාර්තාවක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් ජාතික භාෂාවක් නොවන වෙනත් භාෂාවක් යම් අධිකරණයක භාවිත කිරීමට අවසර දෙමින් විධාන නිකුත් කරනු ලැබිය හැක්කේ ය. එවැනි විධාන ක්‍රියාත්මක කිරීමට සෑම විනිශ්චයකාරවරයෙක් ම බැඳී සිටින්නේ ය.

A 075745

(5) මෙම ව්‍යවස්ථාවෙහි—

அரச

" අධිකරණය " යන්නෙන් කාර්මික සහ වෙනත් ආරාවුල් විනිශ්චය කිරීම හා නිරවුල් කිරීම ඇතුළුව යුක්තිය පසිඳලීම සඳහා ඇතිකොට පිහිටුවන ලද කවර වූ අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් හෝ අධිකරණ කටයුතු නැතහොත් අර්ධ අධිකරණ කටයුතු ඉටු කරන වෙනත් කවර වූ හෝ විනිශ්චය අධිකාරයක් හෝ ආයතනයක් හෝ ආරාවුල් සමථයට පත් කොට නිරවුල් කිරීම සඳහා ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ විනිශ්චය අධිකාරයක් හෝ ආයතනයක් අදහස් වේ.

" විනිශ්චයකාරවරයා " යන්නට කවර වූ හෝ අධිකරණයක සභාපතිවරයා ද මූලාසනාරූඪ නිලධරයා ද සාමාජිකයෙක්ද ඇතුළත් වෙති.

" වාර්තාව " යන්නට උත්තරවාද, නඩු තීන්දු, ආඥා සහ වෙනත් අධිකරණ හා විධායක කාර්ය ඇතුළත් වේ.

25. මේ පරිච්ඡේදයෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි භාෂා භාවිතය සඳහා රජය ප්‍රමාණවත් පහසුකම් සැලැස්විය යුත්තේ ය.

මේ පරිච්ඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි භාෂා භාවිතය සඳහා ප්‍රමාණවත් පහසුකම් සැලැස්විය යුතු බව.